# 1 කොටස -

## දෙවියන්වහන්සේ

ජනයා විසින් නිරතුරුවම අසන ප්‍රශ්න.

ආරම්භ කිරීමට පෙර, මෙම ප්‍රශ්න අප අප වෙතින්ම අසා ගනිමු.

- දෙවියන්වහන්සේ මා හට කවුරුන්ද?
- දෙවියන්වහන්සේ සමඟ මගේ ඇති සම්බන්ධතාවය කුමක්ද?
- දෙවියන්වහන්සේ දඬුවම් කරනවාද?
- මා හට අනුව දෙවියන්ව හසේ යනු ප්‍රේමණීය දෙවිකෙනෙක්ද, එසේත් නැතිනම් උදහස් වන්නාවූ දෙවිකෙනෙක්ද?
- මා දන්නාවූ දෙය සත්‍යයයි මා දන්නේ කෙසේද?

**දෙවියන්වහන්සේ යනු කවුද?**

දෙවියන්වහසේ සර්වබලධාරීය. උන්වහන්සේ අපගේ මැවුම්කරුවාණෝය. අපි එතුමන්ගේ මැවිලිය. උන්වහන්සේගේ පුත්‍ර වූ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන් සේ තුළින් උන්වහන්සේට අපගේ පියාණෙනි යනුවෙන් ඇමතීමට උන්වහන්සේ අපට ඉඩ ලබා දෙනසේක.

**යේසුස් වහන්සේ යනු කවුද?**

යේසුස් වහන්සේ යනු දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. ස්වර්ගයෙහිත්, පොළොවෙහිත් මැවුම්කරුවාණෝ දෙවියන්වහන්සේය. උන්වහන්සේ සියලු දේ මැවූ අතර සියලු මැවිල්ලේ හිමිකරු උන්වහන්සේය.

දෙවියන්වහන්සේ තම ඒකජාතක පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා කුරුසියේ පූජාවක් වී මැරෙන පිණිස පොළොවට එවූසේක. එසේ කළේ මනුෂ්‍ය

වර්ගයා ඔවුන්ගේ පාපයෙන් මුදවා දෙවියන්වහසේගේ දරුවන් ලෙස උන්වහසේ සමඟ එක්සත් කරන පිණිසය. අප මුදාලනු පිණිස අපගේ සියලු පාප යේසුස් වහන්සේ කුරුසිය මත දරාගත්සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් (කරන කොටගෙන) අපගේ මැවුම්කරු වූ දෙවියන්වහන්සේට අපගේ පියාණෙනි යනුවෙන් ආමන්ත්‍රණය කිරීමේ අයිතිය අපට උරුම වී ඇත.

**ශුද්ධ ආත්මයාණන් යනු කවුද?**

යේසුස් වහන්සේ පොළොවෙන් නික්ම යනවිට අප තුළ වාසය කිරීමටත්, අපට මඟ පෙන්වීමටත් උන්වහන්සේගේ ආත්මයාණෝ අපට ලබා දුන්සේක. ශුද්ධ ආත්මයාණෝ යනුවෙන් හඳුන්වන්නේ මෙයයි.

**යේසුස් වහන්සේ දෙවියන්වහන්සේද? ශුද්ධ ආත්මයාණන් වහන්සේ දෙවියන්වහන්සේද?**

ඔව්, අපට ඇත්තේ ත්‍රී එක දෙවිකෙනෙකි. පියාණෝ, පුත්‍රයාණෝ සහ ශුද්ධ ආත්මයාණෝ යනු එක් තැනැත්තේමය. දෙවියන්වහන්සේ, අහසත්, පොළොවත්, පොළොවේ ඇති සියල්ලත් සහ මනුෂ්‍යයාත් මැවුසේක.උන්වහන්සේ, උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් වහන්සේ පොළොවට පැමිණ එහි වාසය කරන පිණිස එවුසේක. යේසුස් වහන්සේ පැමිණියේ භක්තිමත්ව (ධාර්මිකව) ජීවත්වීමේ මඟ අපට උගන්ව න පිණිසත් අප උදෙසා කුරුසියේ මැරෙන පිණිසත්ය. උන්වහන්සේ අප උදෙසා කුරුසිය මත මැරී, එතුමන්ගේ අනර්ඝ වූ රුධිරයෙන් අපගේ පාප සෝදා හැරිය සේක. එසේ කළේ අප දෙවිඳුන් සමඟ එක්සත් කරන පිණිසය. එසේම, එතුමන්ගේ ශුද්ධ ආත්මයාණන් අපට දී තිබෙන්නේ අපගේ හදවත් තුළ වාසය කරන පිණිසත් සදාකාලයටම අප සමඟ සිටින පිණිසත්ය.

*ශුද්ධ ආත්මයාණන්ට අපගේ හදවත් වලට පැමිණෙන ලෙස අප ආරාධනා කරන්නේ නම් උන්වහන්සේ අප තුළට පැමිණ වාසය කරනු ඇත.

**මා හට දෙවියන්වහන්සේ කවුද?**

දෙවියන්වහන්සේ අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණෝය. අපගේ මැවුම්කරු සහ අප එතුමන්ගේ මැවිලි ලෙසට අප බොහෝ විට දෙවිඳුන් වෙතට යොමු වන්නෙමු. නමුත්, මෙම සත්‍යතාවට ඇතුළත් තවත් බොහෝ දේ ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරන කොටගෙන අපි එතුමන්ගේ දරුවෝ සහ එතුමාණෝ අපගේ පියාණන් වන්නාහ. යේසුස් වහන්සේ, එතුමන්ගේ ඒක ජාතක පුත්‍රයාණන් ලෙසට අප විශ්වාස කරන විට, එතුමන් ගේ දරුවන් ලෙස අප එතුමන් සමඟ එක්සත් වේ. අපගේ මැවුම්කාර දෙවිඳුන්ට 'අබ්බා පියාණනි' යනුවෙන් ඇමතීමේ අයිතිය යේසුස් වහන්සේ කරන කොටගෙන අපට ලැබී තිබේ.

**දෙවියන්වහන්සේට අප වෙතින් අවශ්‍ය කරන්නේ කුමක්ද?**

උන්වහන්සේ අපට ප්‍රේම කරන බව අප විසින් දැන ගැනීම උන්වහන්සේට අවශ්‍යය. එසේම, අපගේ පියාණන් ලෙසට අප එතුමාණන්ට ප්‍රේම කිරීම, එතුමාණෝ මහත්සේ ආශා කරන්නකි. අප සෑම කෙනෙක් උදෙසාම එතුමාණන්ට මහත් සැලසුම් ඇති බව අප විසින් දෙන ගැනීම එතුමන්ට අවශ්‍ය කරන දෙයකි. උන්වහන්සේට අප ප්‍රේම කිරීම,එතුමන් වෙතට ලං වීම සහ එතුමන් සමඟ අපගේ ඇති සම්බන්ධතාවය ශක්තිමත් කර ගැනීම එතුමා ණන්ට අවශ්‍ය කරන දෙයකි. යාච්ඤාව තුළ මෙන්ම නිහඬ කාලය තුළ එතුමන්ට කතා කරමින්, එතුමාණන්ගේ මඟ පෙන්වී ම සොයමින් එතුමන් සමඟ කාලය ගත කිරීම එතුමන් අපගෙන් අපේක්ෂා කරයි. ඉතාමත් සමීප ලෙස අප එතුමන්ව දැන ගැනීම එතුමන්ගේ අවශ්‍යතාවයි.

**අපගේ ජීවිත වල අරමුණ කුමක්ද?**

අපගේ ජීවිත වල අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමය. අප උදෙසා එතුමන්ගේ කැමැත්ත වනුයේ අපගේ වචන වලින් විස්තර කළ නොහැකි ආකාරයට හෝ අපට සිතින් සිතා ගැනීමට හැකි ආකාරයටත් ඔබ්බෙන් එතුමන් අපට ප්‍රේම කරන බව අප විසින් දැන ගැනීමත්, එතුමන්ව හොඳින් දැන ගැනීමත් සහ එතුමන්ට ප්‍රේම කිරීමත්ය. එතුමන්ට ප්‍රේම කළ යුත්තේ කෙසේද, එතුමන්ට සේවය කළ යුත්තේ සහ අන් අයට සේවය කළ යුත්තේ කෙසේද සහ අපගේ ජීවිත සාර්ථක වන්නේ කෙසේදැයි දැන ගැනීමට නම් අප එතුමන්ගේ ශුද්ධ අභිමුඛය තුළ දෙවියන්වහන්සේ සමඟ වැඩි කාලයක් ගත කළ යුතුය.

**දෙවියන්වහන්සේ වෙතට ලං වීමට අපට හැකි වනුයේ කෙසේද?**

උන්වහන්සේගේ ශුද්ධ අභිමුඛය තුළ නියමාකාර ලෙස කාලය ගත කිරීම, දෙවියන්වහන්සේගේ වචනය (බයිබලය) කියවීම සහ මෙනෙහි කිරිම, එතුමන්ට යාච්ඤා කිරීම මඟින් සහ අපගේ ජීවිත වල ප්‍රමුඛ ස්ථානය එතුමන්ට දීම මඟින් අපට දෙවියන්වහන්සේ වෙතට ලං වීමට පුළුවන. දිනපතා උන්වහන්සේගේ අභිමුඛයේ ගත කිරීම සහ එතුමන් උදෙසා කාලයක් ලබා ගැනීම අපගේ ඉහළම ප්‍රමුඛතාව විය යුතුය.

**හුදකලා වාසය යනු කුමක්ද? ‘ නිහඬ කාලය’ යනු කුමක්ද?**

දෙවිඳුන්ගේ ශුද්ධ අභිමුඛයෙහි එතුමන්ගේ පාමුලෙහි රැඳෙමින් දෙවිඳුන් සමඟ කාලය ගත කිරීම හුදකලා වාසය නම් වේ. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන සේක. එසේම අප එතුමන් සමඟ කාලය ගත කරමින් අප කෙරේ එතුමන්ගේ ඇති ප්‍රේමය පිළිබඳව දැන ගන්නවාට එතුමාණෝ ආශාකරන සේක. බොහෝ විට අප එතුමන්ට ලං වී , එතුමන්ට යාච්ඤා කරන්නේ අප අවශ්‍යතාවන්ගෙන් පෙලෙන විටදී  පමණී. දෙවියන්ව හන්සේ අප වෙතින් බොහෝ දේ බලපොරොත්තු වන

සේක. අපට එතුමන්ගේ උපකාරය අවශ්‍ය මොහොතේදී පමණක් නොව අපගේ ජීවිත වල සියලු දේම හොඳින් සිදුවන මොහොතේදීත් එතුමන් සමඟ කාලය ගත කිරීම එතුමාණෝ අපගෙන් බලපොරෝත්තු වන සේක. අපගේ ජීවිත වල ඉතාමත්ම වැදගත් තැනැත්තා වීමට එතුමන්ට උවමනාය. අපගේ ජීවිත වල දුක පමණක් නොව අපගේ ජීවිත වල ප්‍රීතිය සහ සන්තෝෂය ද අප එතුමන් සමඟ බෙදා ගැනීම දෙවියන්වහන්සේට උවමනාය. අපගේ ගැටළු, අභියෝග, අපගේ ප්‍රීතිය, අපගේ සාර්ථකත්වය සහ අපගේ ජීවිත වල කොටසක් ලෙස ඇති සියලු දේ පිළිබඳව අප එතුමන් සමඟ සාකච්චා කිරීම එතුමන්ට අවශ්‍යය. අපගේ ජීවිත සහ අපගේ සම්පූර්ණ පුද්ගල භාවයම එතුමන් වෙතට යටත් කිරීම එතුමන්ගේ කැමැත්තය. මන්ද, එවිට අප උදෙසා එතුමන් ගබඩා කොට තිබෙන සියලුම යහපතට සහ සම්පත වෙතට අපව යොමුකරලීමට එතුමන්ට පුළුවන්ය.

ඒ උදෙ සා අප උන්වහන්සේව සෙවීමත්, එතුමන් සමග කාලය ගත කිරීමත් එතුමන්ව දැන ගැනීම සහ එත්මන්ට කීකරුවීමත් කළ යුතුව ඇත.

**අප උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම කුමක්ද?**

සියලු දෙනාටම දෙවියන්ව හන්සේ සමඟ සදාකල ජීවනය ලැබීම එතුමන්ගේ ආශාවය. මනුෂ්‍ය වර්ගයා දෙවියන්වහන්සේට විරුද්ධව කැරළි ගසා පාපයට වැටුණි. නමුත්, අතිමහත් ප්‍රේමණීය වූ දෙවිඳුන්, බලාපොරොත්තුවක් හෝ විසඳුමක් නොමැති වූ අපව අත්හැර දැමුවේ නැත. දෙවිඳුන්, එතුමන්ගේ පුත්‍ර වූ යේසුස් වහන්සේ මේ ලෝකයට එවුවේ, අපගේ පාප උදෙසා පූජාවක් වී මැරෙන පිණිසය.

අප යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කොට පසුතැවිලි වෙන විට, උන්වහන්සේ අපට කමාවෙන අතර අපි එතුමන් සමඟ එක්සත් වන්නෙමු.යේසුස් ක්‍රිස්තුස් නම් පුද්ගලයා කෙරෙහිත්, අපගේ පාප උදෙසා එතුමන් කුරුසියේ කළ පූජාවේ

මරණයත්, එතුමන්ගේ නැවත නැඟිටීමත් විශ්වාස කරමින් අපගේ ගැලවුම්කරු හා ස්වාමින්වහන්සේ ලෙස පුද්ගලික ඇදහිල්ලෙන් එතුමාව පිළිගන්නා විට, අප උදෙසා දෙවිඳුන්ගේ කැමැත්ත වන පාපයේ ප්‍රතිවිපාක වලින් මිදීම සහ සදාකාලික විනිශ්චයෙන් මිදීම අපි සම්පූර්ණ කරන්නෙමු.අපගේ ඉදිරි අනාගතය දෙවිඳුන් සමඟ එතුමන්ගේ ශුද්ධ අභිමුඛයේ ගත කිරීම පිළිබඳව ස්ථිරත්වයක් අපට ලබා ගත හැකිය. එසේම, ගැලවීම යනුවෙන් හඳුන්වන්නේ මෙයයි.

**සැබවින්ම දෙවිඳුන් අපව එතුමන්ගේ අභිමුඛයට කැඳවන සේක්ද?**

දෙවිඳුන්ගේ ශුද්ධ අභිමුඛයේ අප වාසය කිරීම එතුමන්ගේ ආශාවය/ කැමැත්තය. යේසුස්වහන්සේගේ මුල් ගෝලයෝ එතුමන් වෙතට පැමිණ එතුමන් ජීවත් වන්නේ කොහේද යි විමසු කල " පැමිණ බලන්න" යනුවෙන් පිළිතුරු දුන් සේක. එතැන් පටන් ගෝලයෝ එතුමන් අනුව යමින් එතුමන් සමඟ ජීවත් වුවෝය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඊයෙත්, අදත්, සදකාලයටත් එකසේමය. මේ දැන් පවා එතුමන් පිළිබඳව වඩා දැන ගැනීමට අප ඉතා ආශා වන්නේ නම්, එය එතුමන්ගේ ප්‍රේමය අත්විඳීමටත්, එතුමන්ව දැනගැනීමටත්, එතුමන් සමඟ කාලය ගත කිරීමටත් කරන්නාවූ එතුමන්ගේ කැඳවීම වන්නේය. අපට වුවමනා කරන්නේ කැමති වන්නාවූ හදවතක් සහ කැමති වන්නාවූ මනසක් පමණි.

යේසුස් වහන්සේ අප කැඳවමින් කියා සිටින්නේ " බර උසුලන පීඩාවිඳින සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සමාදානය දෙන්නෙමි" යනුවෙනි.

බයිබලයෙහි සඳහන් වන දෙවියන්වහන්සේ ගේ තවත් මනහර පොරොන්දුවක් වන්නේ, "උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ සැම කරදර මා පිට තබපල්ලා" යනුවෙනි.

සබැවින්ම දෙවියන්වහන්සේ ප්‍රේමණීය දෙවිඳුන් වන අතර උන්වහන්සේ සමඟ උන්වහන්සේගේ අභිමුඛයෙහි සිටීමට එතුමන් අපට ආරාධනා කරන සේක.

**යේසුස් වහන්සේව නමස්කාර කරන්නේ ඇයි?**

අප යේසුස් වහන්සේ ව නමස්කාර කරන්නේ එතුමන් දෙවිඳුන්ගේ පුත්‍රයා වන නිසාය. එතුමන් පොළොවට පැමිණියේ අප උදෙසා මැරෙන පිණිසය. එතුමන් පොළොවට පැමිණියේ අප සමඟ විසීමටත්, භක්තිවන්ත ජීවන මාර්ගය පිළිබඳව අපට ඉගැන්වීමටත්ය.එතුමන් පැමිණියේ පාපයේ උදහසින් සහ රෝගයෙන් අපව ගැලවීමටය. උන්වහන්සේ අප උදෙසා කුරුසියේ මැරී, ප්‍රේමණීය ස්වර්ගික පියාණන් වන දෙවියන්වහන්සේ සමඟ අප එක්සත් කළ සේක. එතුමන් කරන කොටගෙන සර්වබලධාරී දෙවිඳුන්ට අපගේ පියාණෙනි යනුවෙන් ඇමතීමට අපට හැකියාව ලැබී ඇත.

**යේසුස් වහන්සේට යාච්ඤා කිරීම සඳහා සුවිශේෂී වූ යාච්ඤා කාලයන් තිබේද?**

නැත, යේසුස් වහන්සේට යාච්ඤා කිරීම සඳහා සතියේ සුවිශේෂ වූ දිනයන් හෝ සුවිශේෂී වූ යාච්ඤා කාලයන් නොමැත. සෑම දිනකම අප එතුමන් සමඟ කාලය ගත කිරීම එතුමන්ගේ කැමැත්තය. දවසේ ඕනෑම මොහොතක අපට එතුමන්ට යාච්ඤා කිරීමට පුළුවන්ය.

අපගේ දවස ආරම්භ කිරීමට පෙර උදෑසන සහ නින්දට පෙර රාත්‍රියේදීත් යේසුස් වහන්සේට යාච්ඤා කිරීම හොඳ පුරුද්දකි. අපගේ දවස ආරම්භ කරන විටදී එතුමන්ගේ ආශිර්වාද උදෙසා අපට යාච්ඤා කිරීමට පුළුවන්ය. රාත්‍රියෙහි දී එතුමන්ගේ ආශිර්වාද සහ අනුග්‍රහය පිළිබඳව එතුමන්ට ස්තුති දීම සමඟ යාච්ඤාවෙන් අපගේ දවස අවසාන කළ හැකිය. දවස අවසානය යනු සම්පූර්ණ දවස පිළිබඳව මෙනෙහි කිරීමටත්, එතුමන්ගේ ආශිර්වා ද පිළිබඳව එතුමන්ට ස්තුති දීමටත්, දවස මුළුල්ලේ අප විසින් කරන ලද වැරදි වලට එතුමන්ගේ සමාව

අයදීමට ඊ ළඟ දවස උදෙසා ආශිර්වාද හා මඟපෙන්වීම සෙවීමටත් හොඳ කාලයකි.

එසේම, අපගේ ආදරණීයයන්, අපගේ මිතුරන්,අපගේ අසල්වාසීන් සහ අනෙකුත් අය උදෙසාත් අප යාච්ඤා කළ යුතුව ඇත. අප අන් අය උදෙසා යාච්ඤා කිරීම දෙවිඳුන්ට ප්‍රිය වූ දෙයකි. එමනිසා අන් අය උදෙසා මැදිහත්කාර කරමින් යාච්ඤාවේ යෙදී සිටීමද අප විසින් කළ යුතු වූ දෙයකි.

## ඔසප් වීම ඇති විටදී යමෙකුට දේවස්ථානයට යාමට හැකිද?

ඔව්, ඔසප් වීම ඇති විටදී පවා යමෙකුට දේවස්ථානයට පැමිණීමට හැකිය. මේ සම්බන්ධයෙන් බාධාවක් හෝ නීතියක් නොමැත. නිරෝගී සහ රෝගී අයටත්, දුප්පත් සහ පොහොසත් අයටත්, ළමා සහ වැඩිහිටි අයටත් සමාන ලෙස එතුමන් වෙතට ළඟා වීමේ අවස්ථාව ඇත. යේසුස්වහන්සේ පොළොවට පැමිණියේ අප අතර වාසය කිරීමටය. දේව පුත්‍රයාණන් ලෙසට එතුමන් ඉපදිය යුත්තේ කොහේදැයි තෝරා ගැනීමේ ඉඩ එතුමාට තිබුණි. ධනවත් නිවසක සුව පහසුව වෙනුවට එතුමන් ගේ උපන් ස්ථානය ලෙසට එතුමා තෝරා ගත්තේ ගවලෙනය. අනෙකුත් ධනවත් මිනිසුන් එතුමන් බැහැදැකීමට පෙර පළමු කොටම එඬේරුන්ට එතුමන්ව බැහැදැකීමට ඉඩ ලබා දුන් සේක.

## අප යාච්ඤා කළ යුත්තේ කෙසේද?

යාච්ඤා කිරීම සඳහා සුවිශේෂී වූ නීති සහ නියමයන් නැත. අපගේ දෑත් දිගහැරගෙන් හෝ හකුලාගෙන අපට යාච්ඤා කළ හැකිය. දණගසා ගෙන හෝ ඉඳගෙන හෝ සිටගෙන අපට යාච්ඤා කිරීමට පුළුවන. වැදගත් වන්නේ අපගේ හදවත්ය. යේසුස් වහන්සේ බලන්නේ අපගේ හදවත් දෙසය.

අප යාච්ඤා කරන විට අපට සහ අපගේ අදරණීයයන්ට එතුමන් කරන්නාවූ සියලු දේ පිළිබඳව එතුමන්ට ස්තුති ප්‍රශංසා කළ යුතුව ඇත. අපගේ දිනපතා යාච්ඤා ජීවිතයේ කොටසක් ලෙසට සුවිශේෂී යාච්ඤාවන් අපට භාවිතා කළ හැකිය. යාච්ඤාව යනු අපගේ දෙවි පියාණන් සමඟ විවෘතව කථා කිරීමේ කාලයක් ලෙස ද කිව හැකිය. අපි අපගේ ස්වර්ගික පියාණන්ට කථා කරන විට අප කථා කරන්නේ කෙසේද, භාවිතා කරන වචන මොනවදැයි කලින්ම සුදානම් විය යුතු නැත. එය ඉබේම සිදු වේ. එලෙසම අපි අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණන් වෙතට ළං වන විට ස්වභාවයෙන්ම අපගේ යාච්ඤාවන් ද ඉබේම සිදුවිය හැකිය. අපි අපගේ වචන කලින්ම සුදානම් කර ගැනීම අවශ්‍ය නොවේ.

අප යාච්ඤා කරන විට බයිබලීය පොරොන්දු ප්‍රකාශ කරමින්, ඒවායින් තමන්ට ඇති උරුමය ප්‍රකාශ කරමින් යාච්ඤා කිරීමද හොඳ පුරුද්දකි. අප යාච්ඤා කරන විට අන්‍යයන් උදෙසා මැදිහත්කාරකම් කරමින් යාච්ඤා කිරීමද යහපත් දෙයකි. අප අන් අය උදෙසා යාච්ඤා කරන විට එය දෙවිඳුන්ගේ හදවත උණුසුම් කරන්නේය.

**යාච්ඤාව උදෙසා සතියේ නියත වූ දිනයන් තිබේද?**

නැත, යාච්ඤාව උදෙසා සුවිශේෂී දිනයන් නොමැත. සෑම දිනයක්ම සුවිශේෂිය. එසේම අපි සෑම දිනකම දෙවිඳුන්ට යාච්ඤා කළ යුතුය. සෑම ඉරිදා දිනකම දේවස්ථාන වල විශේෂ මෙහෙයන් පැවැත්වෙන අතර සමූහයක් ලෙසට දෙවිඳුන් නමදින පිණිස ඒවාට සහභාගී විය යුතුය.

විශේෂිත යාච්ඤාවන් සහ නිරහාරය උදෙසා සතියේ විශේෂ දිනයන් පිළිබඳව අපට තීරණය කළ හැකිය. යාච්ඤා කණ්ඩායමක් ලෙස එකතු වී එකිනෙකාගේ යාච්ඤා අවශ්‍යතා වන් උදෙසා යාච්ඤා කිරීමට ඔබට විශේෂ දවසක් නියම කරගත හැකිය.

**යාච්ඤා කිරීමේදී කටපාඩම් කරගත යුතු සුවිශේෂී වූ පදයන් තිබේද? කුමන වේලාවේද?**

යාච්ඤා කරන වේලාවේදී  සුවිශේෂී වූ පදයන් ඔබ භාවිත කරනවා හෝ නොකරනවා වෙන්නට පුළුවන. අපගේ ප්‍රේමණීය යේසුස් වහන්සේ අපගේ හදවත් වල සහ මනසෙහි ඇති දේ තේරුම් ගන්නා සේක. කෙසේ වෙතත් අප එතුමන්ට යාච්ඤා කරන මොහොතේ දී බයිබලීය පොරොන්දු භාවිතා කරමින් සහ එම පොරොන්දු ඉල්ලා සිටිමින් යාච්ඤා කිරීම හොඳ පුරුද්දකි.

බයිබලය සත්‍යතාවයි.බයිබලයෙහි ඇති සියලු පොරොන්දු අප උදෙසාය, ඒඅප ඒවා කෙරේ අදහා ගන්නා පිණිස සහ ඒවා අපගේ මෙන් උරුම කරගන්නා පිණිසත්ය.

යාච්ඤාව උදෙසා සුවිශේෂී කාලයන් නොමැත. අපට අවශ්‍ය වන ඕනෑම මොහොහක එතුමන් වෙතට අපට ළඟා විය හැකිය. එතුමාණෝ අපට ඕනෑම මොහොතක ළඟා විය හැකි සහ අප උදෙසා සිටින්නා වූ තැනැන්වහන්සේය. අපට සිතා ගැනීමට සහ විස්තර කිරීමට ඇති හැකියාවටත් වඩා එතුමන් අපට ප්‍රේම කරන සේක.

**විවිධ ආකාරයේ යාච්ඤා මොනවාද?**

අපගේ සෑම අවශ්‍යතාවක් උදෙසාම විවිධ වූ යාච්ඤාවන් ඇත. අප උදෙසා සූදානම්ව පවතින යාච්ඤා භාවිතා කරමින් අපට දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමට පුළුවන. මේවා සැලසුම් කරන ලද යාච්ඤාය. ( මෙම පොතෙහි III වන කොටසෙහි ඇති යාච්ඤා බලන්න. ඒවා ඔබගේ යාච්ඤාව උදෙසා යොදා ගත හැකිය). එසේම අපට අපගේම වචන සහ වාක්‍ය වලින් දෙවිඳුන්ට යාච්ඤා කළ

හැකිය.අපට අපගේ වචන නොමැති මොහොතේ පවා එතුමාණෝ අපව තේරුම් ගන්න සේක. එතුමන් අපගේ ප්‍රේමණීය දෙවිඳුන්ය.

අප අන් පුද්ග ලයන් උදෙසා මැදිහත්කාරකම් කිරීම සහ යාච්ඤා කිරීම දෙවියන්වහන්සේට අවශ්‍ය වේ. අප යාච්ඤා කරන විට, අප මෙන්ම සමාන තත්වයන් තුළ ගමන් කරන ( සමහර විට අප ඔවුන් හඳුනන්නේ නැති වීමට පුළුවන) අය උදෙසාද අප යාච්ඤා කළ යුතුය. ඒ ලෙසට අප අන් අයගේ ජීවිත වල ආශිර්වාදයක් බවට පත් වේ. දෙවිඳුන් එයින් මහත් ප්‍රීතියට පත්වේ.

**කණගාටුවෙන් සිටින අවස්ථාවන් වලදී මට යාච්ඤාව කෙරෙහි අවධානය යොමු කළ නොහැක. මා කළ යුත්තේ කුමක්ද?**

කණගාටුවෙන් සහ පීඩනයෙන් සිටින අවස්ථාවන් වලදී අතීතයේදී දෙවිඳුන් ඔබට ආශිර්වාද කළ අවස්ථාවන් පිළිබඳව මතකයට නඟන්න. එතුමන් ඔබගේ ජීවිතයට වගුරන ලද සෑම ආශිර්වාදයක් පිළිබඳවම එතුමන්ට ස්තුති කරන්න. එතුමන් කවුද යන්න පිළිබඳව එනම් එතුමන් අපගේ දෙවියන්වහන්සේ සහ ප්‍රේමණීය පියාණන් වීම පිළිබඳව එතුමන්ට ප්‍රශංසා කරන්න. එතුමන් එතුමන්ගේ ජනතාවට ආශිර්වාද කරන ආකාරය පිළිබඳව සිහිපත් කරන්න. බයිබලයේ ඇති කථා තුළ එතුමන් එතුමන්ගේ ජනතාවට ආශිර්වාද කළ ආකාරය සිහිපත් කරන්න. ( උදා: ඔවුන් ඊජිප්තු දේශයෙ න් පිටතට ගෙන ඒම, රතු මුහුදෙහි මාවතක් සෑදීම,ඔවුන් කාන්තාරයහි ගමන් කළ කාලයේදී ඔවුන් සමඟ විසීම, වළා ටැඹෙනුත් ගිනිටැඹෙනු ත් ඔවුන්ට මඟ පෙන්වීම, කාන්තාරයෙහිදී ඔවුන්ට ආහාර හා ජලය සපයා දීම ආදී වශයෙනි). සියල්ල උදෙසා එතුමන්ට ස්තුති ප්‍රශංසා කරන්න. ඔබ එතුමන්ට ස්තුති ප්‍රශංසා කරන මොහොතේ ඔබගේ හැඟීම් වල සහ මනසේ ස්වභාවයෙහි වෙනසක් සිදුවන බව ඔබ දකීවි. එසේම සඵලවත් ලෙස දෙවින්දුන් හට යාච්ඤා කිරීමට ඔබට හැකි වේවි.

**නිරාහාරය වැදගත් වන්නේ ඇයි?**

නිරාහාරය අප දෙවිඳුන්ගේ සමීපයට ගෙන එන්නේය. විධිමත් නිරාහාරය මඟින් අපට දෙවියවහන්සේගේ සමීපයට පැමිණීමට හැකි වන අතර අප උදෙසා එතුමන්ගේ සැළැස්ම ඉතා පැහැදිලි ලෙස අපට දැන ගත හැකි වේ. නිරාහාරය, දෙවිඳුන් සමඟ අපගේ ඇති සම්බන්ධතාවය ඊළඟ මට්ටම කරා ගෙන යන්නේය.

**නිරාහාරව සිටින්නේ කෙසේද?**

විවිධ වර්ගයේ නිරාහාරයන් සහ විවිධ වර්ගයේ නිරහාරයන් සඳහා විවිධ කාල සීමාවන් පවතී. ස්වභාවයෙන් සහ කාල සීමාවෙන් නිරහාරය වෙනස් වීමට පුළුවන. එය සතියකට දවස් භාගයේ සිට නොකඩවා දවස් 40 දක්වා හෝ ඊට වඩා වැඩි වීමට පුළුවන්ය.

ආධුනිකයන් සඳහා යමෙකුට දවස් භාගයක් වශයෙන් සැලසුම් කළහැකිය. (උදාහරණ ලෙස, උදේ ආහාරය සහ දිවා ආහාරය අත්හැරීම මඟින්). නිරාහාරය යනු යමෙක් ජලය පානය කිරීමෙන් වැළකී සිටීම නොවේ. ඇත්තවශයෙන්ම,නිරාහාරයෙන් සිටින කාලසීමාව තුළදී ජලය පානය කිරීම ඉතා ඉහළ මට්ටමක තිබිය යුතුය. නිරාහාරයෙන් ගත කරන දවසේදී යාච්ඤාව තුළ වැඩිපුර කාලයක් ගත කළ යුතුය. යමෙකුට පස්වරුවේදී හෝ සන්ධ්‍යාවේදී නිරාහාරය නැවැත්විය හැකිය. බොහෝ අය නිරාහාරය නවත්වන්නේ පස්වරු 3.00 ටය. මක්නිසාද අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ අපේ පාප උදෙසා කුරුසියේ මැරී, පාපයේ උදහසින් අපව මුදා, මරණය ජයගත්තාවූ කාලය එය වන බැවින්ය.

කණ්ඩායමක් ලෙසට නිරාහාරයෙන් ගත කිරීම ඉතා බලවත්ය. ජනයාට නිරාහාරයෙන් යුක්තව යාච්ඤාවට එක්වී එකිනෙකාගේ අවශ්‍යතාවන් උදෙසා යාච්ඤා කිරීමට පුළුවන්ය.

ඔබට අන්තර්ජාලය සමඟ සම්බන්ධවී විවිධ ආකාරයේ නිරාහාරයන් පිළිබඳව සොයා බැලීමට හැකිය.

## 3 වන පැයේ යාච්ඤාව යනු කුමක්ද?

පස්වරු 3 හඳුන්වන්නේ මහත් අනුග්‍රහයේ පැය ලෙසිනි. අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා කුරුසියේ මැරී ලෝකය මුදාගත් වේලාව එයයි. දෙවියන්වහන්සේ සදාකාලයටම ලෝකය වෙනස් කළ මොහොත එයයි. ප.ව. 3 යාච්ඤාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වද විඳීම, ඔබත්, මමත් අප සියළු දෙනාමත් මුදා ගැනීම සඳහා එතුමා කුරුසියේ කළ පූජාව අපට මතක් කර දෙන්නේය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වද විඳීම, අප උදෙසා එතුමන්ගේ ප්‍රේමය පිළිබඳව සාක්ෂිය වේ.

කරුණාකර,3 වන පැයේ යාච්ඤාව සඳහා යාච්ඤාවන් පිළිබඳව සඳහන් වන කොටසට යොමුවන්න.

## බයිබලය යනු කුමක්ද?

බයිබලය යනු දෙවියන්වහන්සේගේ ප්‍රේම කතාවයි.එය එතුමන්ගේ දරුවන් වන අපට එතුමන් ප්‍රේම කරන ආකාරය ගැන සඳහන් වන එතුමන්ගේ ප්‍රේම කතාවයි. ඔබ බයිබලය කියවාගෙන යන විටදී අප උදෙසා ඇති එතුමන්ගේ මනහර සැළසුම් පිළිබඳව ඔබ ඉගෙන ගනීවි. දෙවියන්වහන්සේ සියළු දේ මැවුවේ කෙසේද කියාත්,එතුමන් අපට ප්‍රේම කරන්නේ කෙසේද කියාත් අපගෙන් එතුමා ආශා කරන දේ මොනවාද කියාත්, අප උදෙසා මැරෙන පිණිස යේසුස් වහන්සේ එවුවේ ඇයි සහ කෙසේද කියාත්, අපගේ එදිනෙදා ජීවිතය සඳහා එතුමා අපට දෙන අවවාද සහ අනුශාසනා මොනවාද කියා සහ තවත් බොහෝ රසවත් සහ ප්‍රබෝධමත් සත්‍යතාවන් පිළිබඳව බයිබලය විස්තර කරයි.

ශුද්ධාත්ම මඟ පෙන්වීමෙන් ආනුභාව සම්පන්න ලෙස කටයුතු කළ බොහෝ කතුවරයන් විසින් ලියන ලද පොත් කිහිපයක එකතුවක් ලෙස බයිබලය හැඳින්විය හැකිය. එමනිසා, බයිබලය යනු දෙවියන්වහන්සේගේ වචනයයි.

බයිබලයෙහි අන්තර්ගත දේවල්:

- දෙවියන්වහන්සේගේ ප්‍රේම කතාව
- ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ අනන්‍යතාව
- මනහර ඓතිහාසික කථා වල එකමුතුවක්
- යේසුස්වහන්සේගේ ජීවිතය
- අප උදෙසා ඇති දෙවියවහන්සේගේ දිරිමත්කමේ පොරොන්දු
- එදිනෙදා ජීවිතයට අවවාද සහ අනුශාසනා ( ජීවන අත්පොත)
- අප උදෙසා දෙවිඳුන්ගේ නොවෙනස්වන ප්‍රේමය, විශේෂයෙන්ම බලාපොරොත්තුවක් නැති, වේදනාත්මක සහ ප්‍රශ්නකාරී කාලයන් වලදී

**බයිබලයෙහි සඳහන් දෙවියන්වහන්සේගේ ප්‍රේම කතාව කුමක් පිළිබඳවද?**

බයිබලය දෙවිඳුන්ගේ ආදර කතාවයි. එතුමන්ගේ දරුවන් වන අපට එතුමන් ප්‍රේම කරන්නේ කෙසේදැයි සඳහන් වන එතුමාගේ ආදර කතාවයි. දෙවියන්වහන්සේ අහසත්, පොළොවත් මැවුවේ කෙසේද, මනුෂ්‍යයා මැවුවේ කෙසේද, අප උදෙසා

එතුමන්ගේ ප්‍රේමය, අප උදෙසා මැරෙන පිණිස යේසුස් වහන්සේ එවුවේ ඇයි හා කෙසේද සහ අප උදෙසා එතුමාගේ සැළසුම්, එතුමාගේ අනර්ඝ පොරොන්දු පිළිබඳව බයිබලය අපට කියා දෙයි.

බයිබලයේ පරණ ගිවිසුම ඔබ කියවන්නේ නම්, දෙවිඳුන් එතුමන්ගේ ප්‍රේමණීය ජනතාව වහල් භාවයෙන් මුදා, ඊජිප්තුවෙන් පිටතට ගෙන ආවේ කෙසේද, එතුමන් රතු මුහුදේ ජලය බෙදා, මුහුදේ මාර්ගයක් සාදා, එතුමන්ගේ ජනතාව පීඩාවකින් තොරව මුහුදෙන් එතෙර කරවූයේ කෙසේද, රාත්‍රියට ගිනි ටැඹකිනුත්, දහවලට වළා ටැඹකිනුත් එතුමන්ගේ ජනතාවට මඟ පෙන්වූයේ සහ ආරක්ෂා කළේ කෙසේද කියා ඔබ ඉගෙන ගනු ඇත. එසේම, එතුමන්ගේ ආදරණීය ජනතාව කාන්තාරයෙහි සිටින විට පර්වතයෙන් ජලයත්, ස්වර්ගයෙන් ආහාරත් සැපයුවේ කෙසේද යන්න පිළිබඳව කතා කියවනු ඇත. සෙනග දෙවිඳුන්ට අකීකරු වී එතුමන් වේදනාවට පත්කළ ආකාරය පිළිබඳව කියවෙන කතා ද බයිබලයෙහි සඳහන් වේ. නමුත් දෙවියන්වහන්සේ ඔවුන් කෙරෙහි ඇති එතුමන්ගේ ප්‍රේමයෙන් ඔවුන්ට නිතරම සමාව දී, ආශිර්වාද කළ සේක. ඊශ්‍රායෙල් සෙනග අවුරුදු 40 කාන්තාරයෙහි සිටිය නමුත් ඔවුන්ගේ ඇඳුම් පරණ වූයේ නැත. එසේම කෙතරම් දුර කාන්තාරයෙහි පයින් ඇවිද්දත් ඔවුන්ගේ පාද ඉදිමුනේ නැත.

මේවා බයිබලයෙ හි එන කතා කිහිපයක් පමණි.ඔබ බයිබලය කියවන විට දෙවිඳුන්ගේ ප්‍රේමය පිළිබඳ විස්මිත කතා ඔබට හමුවනු ඇත.

**බයිබලය සැබවින්ම සත්‍යද?**

ඔව්, බයිබලය සත්‍යයයි. බයිබලය යනු දෙවියන්වහන්සේගේ වචනය වේ. බයිබලයේ සඳහන් වන කරුණු වල නිවැරදිතාව පිළිබඳව බොහෝ අය විවාද කරති. පසුගිය කාලසීමා ව තුළදී මිනිසුන් නගන ලද බොහෝ ප්‍රශ්න වලට දැනටමත් පිළිතුරු ලබා දී හමාරය. බොහෝ පුරාවිද්‍යාත්මක සාක්ෂි,ඓතිහාසික වාර්තා වැනි දේ හමු වුවාට පසු බොහෝ ගැටළු වලට පිළිතුරු හමුවීම නිදසුනක් ලෙස දැක්විය හැකිය. නව විද්‍යාත්මක සාක්ෂි මතු වුවාට පසු විද්‍යාවට අදාළ

බොහෝ ගැටළු වලට පිළිතුරු ලැබුණු අතර මිනිස්සු ඒවා බයිබලයෙහි ලියවී ඇති දේ සමග සම්බන්ධ කිරීමට සමත් වුහ. මේ ආකාරයට මිනිසුන්ට ඇති අනිකුත් ප්‍රශ්න (බයිබලයෙහි සඳහන්ව ඇති සත්‍යතාවන්ගේ නිවැරදි භාවය පිළිබඳව) වලට, අළුත් විද්‍යාත්මක තොරතුරු වලට, ඓතිහාසික සාක්ෂි සහ වෙනත් එබඳු දේට මිනිසුන් ප්‍රවේශ වන විට නුදුරු අනාගතයේදී පිළිතුරු ලැබෙනු ඇත.

අපට වැදගත් වන්නේ අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය කෙරෙහි සහ දෙවියන්වහන්සේගේ වචනය වන ශුද්ධ බයිබලය කෙරෙහිත් විශ්වාස කිරීමයි. උන්වහන්සේගේ වෙලාවට සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලැබෙනු ඇත. අප විසින් කළ යුත්තේ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම සහ එතුමන් කෙරෙහි අදහා ගැනීමත්ය.

**මම බයිබලය කියවිය යුත්තේ කෙසේද?**

බයිබලය යනු විවිධ වර්ගයේ පොත් වල එකතුවකි. සමහර පොත් වල අන්තර්ගත වනුයේ කතා ය, සමහර පොත් වල ප්‍රඥාවේ වචනය, සමහර පොත් ප්‍රොපේතමය පොත්ය, සමහර පොත් අපට සුවිශේෂී උපදෙස් ද, සමහර පොත් යේසුස්වහන්සේ පිළිබඳවත් එතුමන්ගේ මෙහෙය පිළිබඳවත් වන අතර සමහර පොත් අපව ධෛර්යමත් කරන අතර සමහර පොත් අනාගතයේ එන්නට තිබෙන දේ පිළිබඳව දසුනක් ලබාදේ.

ආරම්භයේ සිට අවසානය දක්වා නවකතාවක් ආකාරයෙන් බයිබලය කියවීමට ඔබ උත්සාහ දැරුවහොත් ටික දිනක් ඇතුලත අනිවාර්යයෙන්ම ඔබට එය එපා වෙනු ඇත. එමනිසා, ඔබට දැන ගැනීමට අවශ්‍ය මොනවාද සහ ඔබ සොයන්නේ මොනවාද යන කරුණු මත පදනම්ව බයිබලය කියවන්නේ කෙසේදැයි දැන ගැනීම යහපත්ය.

බයිබලයෙහි කොටස් දෙකක් ඇත.පරණ ගිවිසුම (යේසුස්වහන්සේට පෙර යුගය) සහ අලුත් ගිවිසුම (යේසුස්වහන්සේගේ යුගය සහ ඊට පසු යුගය).

දෙවියන්වහන්සේගේ මැවීම පිළිබඳව හා ඓතිහාසික යුගයේදී එතුමන්ගේ ජනතාව පිළිබඳව කතා ඔබට කියවීමට අවශ්‍ය නම් පරණ ගිවිසුමෙහි ඇති එබඳු කතා ඇතුලත් පොත් ඔබට කියවීමට පුළුවන්ය. (උදා: උත්පත්ති, නික්මයාම, යොෂුවා ආදී වශයෙනි). යේසුස්වහන්සේ පිළිබඳව සහ එතුමා ගොඩ නගන ලද සභාව පිළිබඳව ඔබට කියවීමට අවශ්‍ය නම්, නව ගිවිසු මේ පළමු පොත් 5 (මතෙව්, මාර්ක්, ලුක්, යොහාන් සහ ක්‍රියා) ඔබට කියවීමට පුළුවන.

බයිබල් පද මෙනෙහි කරන්නේ කෙසේද? බයිබලය අප උදෙසා වන පොරොන්දු වලින් පිරී පවතී. අප බයිබලය කියවන මොහොතේ, සුවිශේෂී පද අපගේ අවධානය අල්ලා ගැනීමට පුළුවන. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට දේව වචනය උගන්වන ලෙසටත්, එයට මඟ පෙන්වන ලෙසටත් අප දෙවියන්වහන්සේට යාච්ඤා කළ යුතුය. එසේම උන්වහන්සේ අප උදෙසා එතුමන්ගේ සැළැස්ම, එතුමන්ගේ පොරොන්දු සහ එතුමන්ගේ කැමැත්ත අපට එළිදරව් කරනු ඇත.

**දෙවියන්වහන්සේගේ සමහර බලවත් පොරොන්දු මොනවාද?(බයිබලයෙහි සඳහන්)**

බයිබලය අප උදෙසා වන දෙවියන්වහන්සේගේ පොරොන්දු වලින් පිරී ඇත. මෙම පොතෙහි iii වන කොටසෙහි (යාච්ඤාව සඳහා වන කොටස) සමහර නිදසුන් ඔබට දැකගත හැකිය.අප උදෙසා වන දෙවියන්වහන්සේ ගේ පොරොන්දු මෙම යාච්ඤා වල අඩංගුය. එසේම මෙම යාච්ඤා අවසානයේ සුවිශේෂී වූ බයිබල් පද සඳහන් කොට ඇත. ඔබට මෙම පද කෙරෙහි සිත යොමුකොට, බලවත් ආකාරයෙන් දෙවියන්වහන්සේගේ ආශිර්වාද ඔබගේ ජීවිතයට ළඟා වෙන පිණිස මෙම පද මෙනෙහි කර ගන්න.

**යේසුස්වහන්සේ වේදනාත්මක මරණයකින් මිය ඇදුණි. ඔහු දෙවියන්වහන්සේ වන්නේ කෙසේද?**

ස්වර්ගයෙහිත්, පොළොවෙහිත් මැවුම්කරු වූ දෙවියන්වහන්සේ අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණෝය.එසේම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. එමනිසා පාපයෙන් සහ සදාකාලික මරණයෙන් අපව මුදන පිණිස, කුරුසියේ මරෙන්නාවූ පූජාවේ බැටළු පැටවාණන්ලෙස දෙවියන්වහන්සේගේම පුත්‍ර වූ යේසුස් වහන්සේ අප වෙත එවුවේ, අප කෙරේ ඇති එතුමන්ගේ මහත් ප්‍රේමය නිසාමය. පාපයෙන් සහ සදාකාලික මරණයෙන් අප ගලවාගත හැක්කේ දෙවියන්වහන්සේට මිස වෙන කවරෙකුටද? බොහෝ මිනිසුන් යේසුස්වහන්සේ යනු කවුදැයි නොදැන සිටයදී පවා මම,ඔබ සහ සියලු දෙනා උදෙසා මැරෙන්නාවූ යේසුස්වහන්සේට වඩා වෙන කවරෙකුට අපට ප්‍රේම කළ හැකිද? අප සෑම කෙනෙක්ම මුදා ගන්නා පිණිස මැරුණු නමුත් අප බොහෝ දෙනෙක් එය දන්නේ නැත. එතුමන්ට වඩා වෙන කෙනෙකුට අප උදෙසා ප්‍රේම කළ හැකිද?

**දෙවියන්වහන්සේ සර්වබලධාරීය. දෙවියන්වහන්සේට එතුමන්ගේ බලයෙන් අපගේ පාප කමා කළ හැකිය. යේසුස්වහන්සේට අප උදෙසා මැරෙන්නට සිදු වුයේ ඇයි?**

අපගේ පිය වූ දෙවියන්ව හන්සේ ප්‍රේමණීය දෙවිකෙනෙක්ය. අප සෑම කෙනෙකුටම එතුමන් කෙතරම් ප්‍රේම කරන්නේදැයි වචන වලින් විස්තර කළ නොහැක. කෙසේ වෙතත්, එතුමන් එතුමන්ගේ ප්‍රතිපත්ති වලට අවංකය. පව්කාරයන්ට දඬුවම් ලැබිය යුතුය යන්න දෙවියන්ව හන්සේගේ යුක්තියට සහ ධර්මිෂ්ඨකමට අවශ්‍ය කරන දෙය වේ. නමුත් ඒ සමගම, එතුමා අපට අතිමහත් ලෙස ප්‍රේම කරන සේක. එසේම පව්කාර අපව නිදහස් කරන පිණිස එතුමාගේ ප්‍රේමය සහ දයාව උවමනා කෙරේ. අපගේ ස්ථානය ගන්නා පිණිස සහ පාපයේ ප්‍රතිවිපාක වලට මුහුණ දෙන පිණිස අපගේ ගැලවුම්කරු වන යේසුස්වහන්සේ එවා, දෙවියන්වහන්සේ මේ අවශ්‍යතා දෙකම බලාගත් සේක. අප උදෙසා දෙවියන්වහන්සේගේ ප්‍රේමය එබඳුය!!මේ ප්‍රේමයට සමාන කරන්නට හැකි වෙන කවුරුන්ද?

**යේසුස්වහන්සේ මරණය පරාජය කළේ කෙසේද?නැවත නැඟිටීම යනු කුමක්ද?**

යේසුස්වහන්සේ අප වෙනුවට තමන්ම කුරුසියේ පූජා වීමට ඉඩ හැරියේ ඒ මඟින් අපගේ පාප වල කමාව ලැබෙන පිණිස සහ පාප සෝදා හරින පිණිසය. උන්වහන්සේ අප උදෙසා මැරී තැන්පත් කරන ලද්දේය. තුන් දිනකට පසු එත්මානෝ මරණය පරාජය කරමින් නැවත ජීවනයට පැමිණුනු සේක. මෙය නැවත නැඟිටීම යනුවෙන් හැඳින්වේ. එතුමන්ගේ නැවත නැඟිටීමෙන් පසු එතුමන්ගේ ගෝලයන් සමඟ දවස් 40ක් ගත කොට ස්වර්ගයට නැඟුණු සේක. එතුමන්ගේ මහිමයෙන් යුක්තව එතුමාණෝ නැවතත් පොළොවට පැමිණෙන සේක.

යේසුස්වහන්සේ අපගේ ගැළවුම්කරුවාණෝය.එතුමන්ගේ ශුද්ධ නාමයට හඬගසන කවුරු නමුත් ගලවනු ලබන්නේය.

**යේසුස්වහන්සේගේ විශේෂත්වය කුමක්ද? යේසුස්වහන්සේගේ අද්විතීය භාවය කුමක්ද?**

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. එතුමාණන්ගේ අද්විතීය භාවයට බොහෝ කාරණා ඇත. එතුමා මේ ලෝකයට පැමිණියේ අප අතරෙහි ජීවත්වීමට සහ භක්තිවන්ත ජීවිතය ගත කරන ආකාරය ඉගැන්වීමටත්ය . උන්වහන්සේ කන්‍යාවක වූ මරියතුමිය තුලින් ඉපදුණි. එතුමා ඉපදුණේ ගවලෙනකය. එතුමා දෙවියන්වහන්සේ ලෙසට පොළොවේ සිටිය කාලය තුලදී එතුමාගේ සුව පහසුව සඳහා මේ ලෝකයේ සියළුම සැප සම්පත් තෝරා ගැනීමේ හැකියාව තිබුණි. ඒ වෙනුවට එතුමා මිනිසුන්ගේ නිහතමානී ජීවන රටාව තෝරා ගත් සේක. එතුමාට අවශ්‍ය වුයේ අප අතර වාසය කරන්නටය. එතුමා ඉපදුනු පසු දේව දුතයෝ ගායනා කරමින් එය සැමරූහ. උන්වහන්සේට ගෞරවය පිණිස විශේෂ තාරකාවක් දිස් වුණු අතර එතුමාට ගෞරව කරන පිණිස ප්‍රඥාවන්තයෝ දුරක සිට පැමිණියහ.

පාපය සහ පරික්ෂාව මඟහැර භක්තිවන්තව ජීවත්වන අයුරු එතුමා පෙන්වා දුන් සේක. සදාකාලයටම පාපයෙන් සහ මරණයෙන් අප මුදවන පිණිස එතුමාණෝ කුරුසිය මත මැරුණු සේක.

අප එතුමාගේ සමීපයට ගෙන එන පිණිස හා අප ගලවන පිණිස දෙවිඳුන් මිය යාමක් පිළිබඳව ඔබ වෙන කොහේ හෝ අසා තිබේද? එසේ කළේ සදාකාලයටම අප එතුමා සමඟ සිටිනු පිණිසය.

යේසුස්වහන්සේගේ වද විඳීම සහ කුරුසිය මත සිදුවන එතුමාගේ මරණය යනු අපගේ ස්වර්ගික පියාණන් අප කෙරෙහි ඇති එතුමාගේ ප්‍රේමය ඔප්පුකර පෙන්වීමයි.

මරණයෙන් ජය ගැනීම තහවුරු කරමින් යේසුස්වහන්සේ තුන්වෙනිදා නැවත නැගිටුණු සේක. සියල්ලටම ඇති අපගේ පිළිතුර එතුමාය. ඇත්තවශයෙන්ම , එතුමා අපගේ එකම පිළිතුරය. එතුමා අපගේ සුවකරන්නා ය, අපගේ ආරක්ෂකයාය, අපගේ ස්වාමියාය, අපගේ දෙවිඳුන්ය, අපගේ මිතුරාය, අපගේ මඟ පෙන්ව න්නාය. අපගේ සහෝදරයාය, අපගේ ස්වාමින්වහන්සේ සහ ගැලවුම්කරුය. ලැයිස්තුව මෙලෙස ගලායයි.

මිනිසුන් ඔවුන්ගේ දෙවිවරුන් අභියසට ඔවුන්ගේ හොඳම පූජාවන් ගෙන ඒමට නැඹුරුවේ. දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේ මෙබඳු පූජා වලට කැමති නොවේ. එතුමා කැමති වන්නේ අප එතුමා වෙතට අපගේ බිඳුණු බව,අපගේ ගැටළු, අපගේ රෝග, අපගේ දුක රැගෙන එනවාටය.එවිට එතුමාට ඒවා අප වෙතින් ඉවත් කර, එතුමා ගේ කරුණාවෙන්, දයාවෙන් සහ එතුමාගේ ප්‍රේමයෙන් අප පිරවිය හැකි බැවිනි.

**යේසුස්වහන්සේගේ රුධිරයෙහි ඇති විශේෂත්වය කුමක්ද?ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය ගැන මිනිසුන් නිතරම කථා කරන්නේ ඇයි?**

යේසුස්වහන්සේගේ රුධිරයෙහි ඉතාම සුවිශේෂී වූ වැදගත්කමක් ඇත. යමෙක් දේව පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ කෙරෙහි අදහාගන්න විට සහ ඔහුගේ/ ඇයගේ ගැලවුම්කරු ලෙස යේසුස්වහන්සේව පිළිගන්නා විට, ඔහුගේ/ ඇයගේ පාප ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් සෝදා හරින්නාසේම ඔහු/ ඇය සදාකාලික මරණයෙන් මුදාලයි.මෝසෙස්ගේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ කාලයේදී (පරණ ගිවිසුම යුගයේ) ජනයාගේ පාප වලට සමාව ලබා ගැනීම සඳහා දේවමාළිගාවේ පූජාසනය වෙතට සතුන්ගේ රුධිරයන් කරන පූජාවන් පූජකයා විසින් අවුරුද්දකට වරක් සිදුකරන ලදී. සතුන්ගේ රුධිරයෙන් කරන මේ පූජාව සෑම වසරකම සිදු කළේය. ව්‍යවස්ථාවට අනුව රුධිරය වැගිරීමකින් තොරව සමාව දීමක් නොමැත.

කුරුසිය මත දී යේසුස්වහන්සේගේ වද විඳීම , පූජා විඳීම සහ රුධිරය මඟින් සදාකාලයටම අපගේ පාප වලින් අප මුදනු ලැබිණී. අප උන්වහන්සේ කෙරෙහි අදහා,අපගේ පාප පාපොච්චාරණය කොට, පසුතැවිලි වනවිට එතුමන් අපට සමාව දෙන සේක. උන්වහන්සේගේ අනර්ඝ රුධිරයෙන් අපගේ පාප සෝදා සදාකාලයටම අප මුදාලන සේක.යේසුස්වහන්සේගේ රුධිරය යන පද පෙළින් ප්‍රකට කරන්නේ කුරුසිය මත සිදුවන යේසුස්වහන්සේගේ පාප පූජාවය. අප උදෙසා යේසුස්වහන්සේගේ සම්පූර්ණ වන්දි ගෙවීමය. ඔබත්, මමත්, අප සියලු දෙනා උදෙසාත් යේසුස්වහන්සේ රුධිරය වගුරා මැරුණු සේක. අපි පව්කාරයෝව සිටියෙමු. එසේම අපගේ මිදුම්කරු ලෙස අප යේසුස් වහන්සේ පිළිගෙන තිබෙන නිසා අප දැන් මුදන ලද්දෝ වෙමු. ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරය සියලු උවදුරින් අප ආරක්ෂා කාන්නේය.

**යමෙක් යේසුස් වහන්සේ සමඟම වෙනත් දෙවිවරුන්ටද යාච්ඤා කරන්නේ නම් යේසුස් වහන්සේ කුමක් සිතයිද? යේසුස් වහන්සේට කෙසේ හැඟෙයි ද?**

ඔබ ප්‍රේම කරන පුද්ගලයා ඔබට ලැබිය යුතු සහ ඔබ කැමති ආකාරයට ඔබට ප්‍රේම නොකරයි නම් එය ඔබට හැඟෙනුයේ කෙසේද?ඔබට දුක සිතේවි. නමුත් ඔබ තවදුරටත් එම පුද්ගලයාට ප්‍රේම කරමින් බලාපොරොත්තුවෙන් සිටීවි.

එලෙසම, අපගේ ජීවිතයේ පළමු තැන එතුමාට නොදෙන විට යේසුස් වහන්සේට වේදනාව දැනෙයි.කෙසේ වෙතත් යේසුස් වහන්සේ අපගේ හදවත් සහ සිත් දන්නා සේක.යමෙක් අපගේ ප්‍රේමණීය පියාණන් ලෙස දෙවියන්වහන්සේට ප්‍රේම නොකරන විට, ඔහුගේ/ඇයගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය එතුමන්ට නොදෙන විට, එතුමා ඉවසිල්ලෙන් බලා සිටින සේක. දිනෙක අප සියලු දෙනා සත්‍යය දැන ගන්නා අතර සත්‍යය අප නිදහස් කරනු ඇත. දිනෙක අප සියලු දෙනා දෙවියන්වහන්සේ ගේ ප්‍රේමය තුළ එතුමා සඟ එක්සත් වේවි යයි යේසුස් වහන්සේ ඉවසීමෙන් බලාසිටින සේක.

**කුරුසියක ඇණ ගසා වේදනාවෙන් සිටින යේසුස් වහන්සේව මිනිසුන් නමදින්නේ කෙසේද? එය හිතක් පපුවක් නැති, වේදනාත්මක හැඟීමක් ගෙනදේ.**

කුරුසිය දෙවියන්වහන්සේගේ ප්‍රේමය, දෙවියන්වහන්සේ එතුමාගේ ඒකජාතක පුත්‍රයාණන් එවූ ආකාරය, අපගේ පාපයෙන්, රෝගයෙන් සහ මරණයෙන් අප මුදාලනු පිණිස අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ට මිය යෑමට සිදුවීම අපට මතක් කර දේ. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන බවත් අපගේ පුද්ගලික ගැලවුම්කරු ලෙස යේසුස් වහන්සේව පිළිගත් විට සදාකාලයටම අපට එතුමන් සමග සිටිය හැකිය යන සුභාරංචිය කුරුසිය අපට දන්වාලයි. බලාපො රොත්තු ව සහ ප්‍රේමය පිළිබඳව කුරුසිය අපට දන්වාලයි. එම දැක්මෙන් අප කුරුසිය දෙස බලන විට යේසු ස් වහන්සේ කුරුසිය මත සිටීමේ ඇති වැදගත්කමෙ හි සැබෑ අර්ථය අපට තේරුම් ගත හැකිය.

එසේම අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තු ස්වහන්සේ මරණය පරාජය කොට නැවත නැගිටුණු බවද අප මතක තබා ගත යුතුය. එතුමා අපගේ ජීවමාන දෙවියන්වහන්සේය.

**කිතුණුවන් බටහිර සංස්කෘතිය පිළිගෙන ඇත.මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගන්නේ නම් මමත් ඔවුන් මෙන් විය යුතුද?**

වෙනස්වීම සිදුවන්නේ හදවතේ සහ මනසේය. යේසුස් වහන්සේ කෙරේ අදහා ගැනීමට බාහිර වෙනස්කම් අවශ්‍ය නොවේ. යමෙක් යේසුස්වහන්සේ පිළිගනිමින් යාච්ඤාව සහ නිහඬ කාලය ගත කරන විට දෙවියන්වහන්සේට ළං වන්නේ කෙසේදැයි ශුද්ධාත්මයා ණන් වහන්සේ ඔහුට/ඇයට මඟ පෙන්වයි. සමහර මිනිසුන් සමහරවිට ඔවුන්ගේ සංස්කෘතියට සහ සමාජයට අළුත් දේ පිළිගැනීමට පුළුවන.නමුත් එය නියෝගයක් නොවේ.ලෝකයේ දේවල් වලට වඩා දෙවියන්වහන්සේට වැදගත් වන්නේ අපගේ හදවත් සහ මනස ය.

**මම යේසුස් වහන්සේ අදහමි. මගේ ජීවන රටාව තුළ වෙනස් විය යුතු දෙයක් තිබේද?**

ඔව්, නමුත් ඔබගේ ජීවන රටාවේ ඕනෑම දෙයක් වෙනස් කිරීමට ඔබ ඔබටම බල කළ යුතු නොවේ. යේසුස්වහන්සේ ඔබගේ පුද්ගලික ගැලවුම්කරු සේ පිළිගත් පසු ඔබගේ හදවත, මනස ආත්මය සහ කාලය එතුමාට කැප කරන්න. එතුමන්ගේ අභිමුඛයෙහි නිහඬ විවේකය, නිහඬ කාලය සහ යාච්ඤාවෙන් කාලය ගත කරන්න.මෙම විනය ඔබ ඇතිකර ගත් විට දෙවියන්වහන්සේ සමඟ වඩා ගැඹුරු හා වඩා සමීප පෞද්ගලික සම්බන්ධතාවක් ඇති කර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ මඟ පෙන්වනු ඇත.

**කිතුණුවෝ දේවස්ථානයේදී වයින් බොනවාද?**

නැත, මෙය කිතුණුවන් කෙරෙහි ඇති වැරදි හැඟීමකි. දේව මෙහෙයට සම්බන්ධ වුවහොත් හොඳයි නේද? එවිට ඔබට දේව වචනයට සවන් දී ඒ හා සම්බන්ධ වතාවත් දකින්නටත්, එම වතාවත් වල තේරුම වටහා ගැනීමටත් ඔබට හැකිය.

**දේවස්ථානය යනු දෙවිඳුන් නමදින්නාවූ ස්ථානයකි. යමෙක් පාවහන් පැළඳගෙන නැමඳුම් ස්ථානයට ඇතුළු වන්නේ කෙසේද?**

අපගේ ගැළවුම්කරු ලෙස අප ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් විට, අපම දෙවියන්වහන්සේගේ මාළිගාව බවට පත්වෙන අතර ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ ජීවත් වේ. අපගේ බාහිර පවිත්‍රතාව ගැන සැළකීමට පෙර අපගේ හදවත් සහ මනස ශුද්ධව පවිත්‍රව තිබේද යනුවෙන් අප අපගෙන්ම ප්‍රශ්න කිරීම වැදගත් වේ. අප යේසුස් වහන්සේ අනුගමනය කරනවා යනු මුළුමනින්ම අපගේ හදවතේ සහ මනසේ ඇතිවන ආකල්ප හා බැඳුනු දෙයකි.

සාමාන්‍යයෙන් යමෙක් දේවස්ථානයට ඇතුළු වනවිට පාවහන් ගැලවීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, කුඩා නගරවල සහ ගම්මාන වල පිහිටි දේවස්ථානවල ජනයා තම දේවස්ථානය පවිත්‍රව තබා ගැනීමේ අරමුණින් දේවස්ථානයට ඇතුළු වීමට පෙර පාවහන් ගලවා ඒමට වැඩි කැමැත්තක් දක්වති.

**යේසුස්වහන්සේ අනුගමනය කිරීමට මා කළ යුත්තේ කුමක්ද?යේසුස්වහන්සේ අදහන්නේ නම් මා අත්හල යුත්තේ මොනවාද?**

යේසුස් වහන්සේ යනු දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව පිළිගෙන එතුමන්ට ඔබ උදෙසා මහත් සැලසුම් ඇතැයි යන ස්ථිරත්වයෙන් ඔබගේ සියලු යාච්ඤා ඉල්ලීම් දෙවියන් වහන්සේ වෙතට ගෙන එන්න.එතුමන් අපගේ දෙවිඳුන් බව, අපගේ සුවකරන්නා බව, අපගේ මිදුම්කරු බව, අපගේ මිතුරා සහ ගැලවුම්කරු බව ඔබේ හදවතින් දැනගන්න.

දිනපතා දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි කාලය ගත කිරීමට ඔබගේ දිනපතා ජීවිතයෙහි විනයක් ඇති කරගන්න. ඔබගේ ජීවිතයෙහි සෑම පියවරකදීම දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න. ඔබගේ ජීවිතයෙහි අත් හැරිය යුතු දේ මොනවාදැයි යාච්ඤාවෙන් යුක්තව එතුමාගෙන් අසා සිටින්න.එසේම ශුද්ධාත්මයාණන්ගේ බලය තුළ යහපත් ආකාරයට ඔබගේ ජීවිතය වෙනස් කරන්න දෙවියන්වහන්සේ ඔබට මඟ පෙන්වන ලෙස හා ශක්තිය දෙන ලෙස යාච්ඤා කරන්න. ඔබ කන බොන ආහාර, ඇඳුම්, නිවාස, සංස්කෘතිය හෝ එබඳු ආකාර ඔබගේ ජීවන රටාවේ කිසිම දෙයක් ඔබ ඇත

හැරිය යුතු නොවේ. ඔබගේ හදවතේ සහ මනසේ අභ්‍යන්තර වෙනස් වීම කෙරේ අවධානය යොමු කොට යේසුස් වහන්සේට ඔබට මඟ පෙන්වීමට ඉඩ හරින්න.

**යේසුස් වහන්සේ අදහන්නේ නම් මා විසින් අනුගමනය කළ යුතු වතාවත් මොනවාද?**

වැදගත් වන්නේ දෙවියන්වහන්සේ සමඟ අපගේ ඇති සමීප සම්බන්ධතාවයයි.වතාවත් ඊට පසුවය.දෙවියන්වහන්සේ අපගේ අවශ්‍යතා දන්නා සේක. සෑම දිනකම දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි සහ යාච්ඤාවෙහි ගත කරන පිණිස ඔබගේ දිනපතා ජීවිතයෙහි විනයක් ඇති කර ගන්න.යාච්ඤා කිරීම සඳහා අනුගමනය කළ යුතු සුවිශේෂී වූ ආකාරයක් නැත.ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි කාලය ගත කිරීමට පටන් ගන්නා විට එතුමා ඔබට මඟ පෙන්වන අතර එතුමා සමඟ වූ ඔබගේ ගමන ඔබ ප්‍රීතියෙන් භුක්ති විඳිනවා ඇත.

එසේම ඔබට වැඩිපුර දැනගැනීමට අවශ්‍ය නම් හෝ ඔබගේ මනසෙහි සුවිශේෂී වූ ප්‍රශ්න තිබේ නම් යේසුස් වහන්සේ අනුගමනය කරන වෙනත් අය සමඟ සාකච්ඡා කිරීම ද කළ හැකිය.

**දේවස්ථානයට යෑම අවශ්‍යද?**

දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක. ඔබ එතුමාට ප්‍රේම කරනවාද? දෙවියන්වහන්සේ දැනගැනීම නම් වූ ඔබගේ ආත්මික ගමනේ ඔබ ලබා ඇති වර්ධනය පිළිබඳව ඔබ සෑහීමට හෝ සතුටට පත් වේද?නැතිනම් එතුමාව දැන ගැනීමට සහ එතුමාට වඩා වැඩියෙන් ප්‍රේම කිරීමට ඔබට අවශ්‍යද?එතුමාට ළං වීමට සහ ඔබගේ ජීවිතයෙහි එතුමාගේ අනුග්‍රහය හා ආශිර්වාදය අත් විඳීමට ඔබට අවශ්‍යද?

වතාවතක්/ චාරිත්‍රයක් පැවැත්වීම සඳහා දේවස්ථානයට නොයන්න. දෙවියන්වහන්සේ කෙරේ ඇති ප්‍රේමය නිසාත්, එතුමා සමඟ ඔබගේ ඇති පුද්ගලික

සම්බන්ධතාවය නිසාත් දේවස්ථානයට යන්න. ඔබ එතුමන්ගේ ප්‍රේමය වැඩි වශයෙන් අත්දකින විට එතුමන් සමඟ ඔබගේ ගමනට පෙරටුව යාමටත්, මඟ පෙන්වීමටත් එතුමාට ඉඩහරින්න.

**රූප නමස්කාරය යනු කුමක්ද?**

යමෙක් සැබෑ වූ දෙවියන්වහන්සේට වඩා යමක් හෝ යම් කෙනෙක් උසස් කොට සළකන්නේ නම් හෝ නමස්කාර කරන්නේ නම් එය රූප නමස්කාරයයි.යමෙක් දෙවියන්වහන්සේ යයි සිතා පිළිමයක් උසස් කොට සැළකීම හෝ නමස්කාර කිරීම කළ හැකිය, එසේත් නැතිනම් යමෙක්, අනෙක් සියල්ලටම වඩා ඉතා ජනප්‍රිය කීර්තිමත් පුද්ගලයෙකු ඉතා උසස් කොට සැළකීම හෝ අගය කිරීම කළ හැකිය. යමෙක් වෙන කිසිවෙකුට හෝ කිසි දෙයකට වඩා මුදල් වලට ප්‍රේම කළ හැකිය.මේවා රූප නමස්කාරය සඳහා උදාහරණ වේ.

අපව නිර්මාණය කර ඇත්තේ ස්වර්ග යෙහිත්, පොළොවෙහිත් මැවුම්කරු වූ අපගේ දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමටත් නමස්කාර කිරීමටත්ය. එතුමා අපගේ ප්‍රේමණීය පියාණන් වන අතර අපි එතුමාගේ දරුවෝ වෙමු.අපගේ ජීවිත වල අනිකුත් සියල්ලටම හා සියළු දෙනාටම වඩා පළමු ස්ථානය එතුමාට හිමිවිය යුතුය.

**මිනිසුන් රූප නමස්කාර කරන්නේ ඇයි? මිනිසුන් රූප නමස්කාර නොකළ යුතුයි නොවේද?**

සාමාන්‍යයෙන් මිනිස්සු අනෙක් අය කරන දේ බලා හෝ වැඩිහිටියන්ගෙන් ඉගෙනගත් දේ හෝ අනුගමනය කරති. බොහෝ අවස්ථා වලදී මිනිසුන් චනාවත් පිළිබඳව ප්‍රශ්න නොකරන අතර එම චනාවත් සහ ක්‍රියාවන් පිටුපස ඇති අදහස තේරුම් ගැනීමට උත්සාහ නොගනී.දෙවියන් යනු රූප සහ පිළිම යනුවෙන් වැරදි

ලෙස විශ්වාස කරන බොහෝ අය සිටිති. බොහෝ මිනිසුන් රූප වලට යාච්ඤා කිරීමෙන් කෙළවර වනුයේ ඒ ආකාරයටය. අප කරන්නේ මොකක්ද සහ එසේ කරන්නේ ඇයි ද යනුවෙන් කුතුහල සහගත වීමට පටන් ගත් විට, අප සත්‍ය සෙවීමේ ක්‍රමයට ඇතුලත් වේ. අප අපගේ හදවත් තුළ දෙවියන්වහන්සේගේ සත්‍යතාව සොයන විට, දෙවියන්වහන්සේ එතුමාවත්, එතුමාගේ ප්‍රේමයත් වඩ වඩා අපට එළිදරව් කිරීමට පටන් ගනී. එසේම, එතුමාගේ සත්‍යය අපව නිදහස් කරන්නේය.

අපට අපගේ දෙවිපියාණන්ට යාච්ඤා කිරීමට හැකියාව තිබියදී රූප වලට යාච්ඤා කිරීමේ අවශ්‍යතාවක් තිබේද?

**බොහෝ මිනිස්සු ඉර, සඳ, තාරකා, ග්‍රහ ලෝක සහ ස්වභාවධර්මය නමස්කාර කරති. ස්වභාවධර්මය නමස්කාර කිරීම වැරදියි ද?**

දෙවියන්වහන්සේ ස්වර්ගයත්, පොළොවත් මැවූ සේක. ස්වර්ගයෙහිත් පොළොවෙහිත් ඇති සියලුම දේ උන්වහන්සේ මැවූ සේක. ස්වබාදහම, ඉර, සඳ තාරකා සහ ග්‍රහ වස්තු එතුමාගේ නිර්මාණය. ජනයා නමස්කාර කළ යුත්තේ මැවිල්ල ද එසේත් නැතිනම් මැවුම්කරුද?

සමහර මිනිසුන් ඉර, සඳ, තාරකා සහ ග්‍රහ ලෝක දෙවියන් වශයෙන් හෝ දෙවියන් ඒවායේ වාසය කරන්නේය යනුවෙන් සිතයි.අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණන් වන දෙවියන්වහන්සේ කෙරේ අපගේ අවධානය යොමු නොකරන්නේ මන්ද?අප මැවුවා වූ සහ අපට ප්‍රේම කරන්නා වූ, අපගේ ආදරය කෙරේ මහත් ආශා වන්නා වූ අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණන්ව නමස්කාර නොකරන්නේ ඇයි?

**සමහර කිතුණුවෝ සෑම මොහොතකම පාපය ගැන කථා කරති. ඔවුන් කුරිරු මිනිසුන්ය!!යමෙක් පාපය පිළිබඳව සාකච්ඡා කළ යුත්තේ ඇයි?**

දෙවියන්වහන්සේ අප උන්වහන්සේගේ සමානත්වයෙන් මැවුව නමුත් පාපය අපව දෙවිඳුන්ගෙන් වෙන් කළේය.අපව නැවතත් එතුමා වෙතට කැඳවා ගනු පිණිස අප කර තිබෙන සියළුම පාප වලට පූජාවක් සේ අප උදෙසා කුරුසියේ මැරෙන පිණිස දෙවියන්වහන්සේ එතුමාගේ පුත්‍ර වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එවූ සේක. එසේම යේසුස්වහන්සේගේ පූජාවේ මරණය හා එතුමාගේ නැවත නැඟිටීම තුළින් සදාකාලික පාපයෙන් සහ මරණයෙන් අපි මුදනු ලැබ සිටින්නෙමු. එසේ වන්නේ දෙවියන්වහන්සේගේ පුත්‍ර වන යේසුස්වහන්සේ අපගේ ගැළවුම්කරු හා ස්වාමින්වහන්සේ ලෙස පිළිගතහොත් පමණි.

මෙම සත්‍යතාව තේරුම් ගන්න මිනිසුන්, අන් අයද ගැලවීම ලබන පිණිස මෙම සත්‍යතාව අන් අය සමගද බෙදා ගැනීමට ඉතාමත් උද්යෝගී වේ. පාපය ගැනත්, පාපයේ ප්‍රතිවිපාක ගැන සහ පාපයෙන් ගැලවෙන් මාර්ගය ගැනත් බොහෝ මිනිසුන් කතා කරන්නේ මේ නිසාය.

**සෑම කෙනෙක්ම පව්කාරයෙක් නොවේ. සෑම කෙනෙක්ම උපදින්නේ පව්කාරයෙක් ලෙස යැයි යමෙක් පවසන්නේ කෙසේද?**

දෙවියන්වහන්සේ තමන්ගේ ස්වරූපයෙන් මැවූ ප්‍රථම මිනිස් යුවළ වන ආදම් සහ ඒව දෙවියන්වහන්සේට අකීකරු වූ අතර ඔවුන් කරන කොටගෙන පාපය මේ ලෝකයට ආවේය. අපි අන් අය සමඟ බෙදා හදා ගෙන සහ අන් අය ගැන සැළකිය යුතුය යනුවෙන් කුඩා අවධියේදී අපට උගන්වා තිබුණි. එසේම යම් දෙයක් අප උදෙසා පමණක් තබා ගැනීම සහ අන් අය සමඟ බෙදා නොගැනීම ආත්මාර්ථකාමී වීමකි, කෑදර වීමකි,එසේම වැරදි දෙයකි.

ඔබ කුඩා බිළිඳුන් පරික්ෂා කර තිබේද?ඔබ බිළින්දෙකු අතට සෙල්ලම් බඩුවක් දුන් විට බිළිඳා එය ඔහුගේ/ ඇගේ අතින් තදින් අල්ලා ගනී. ඔබ එය බිළිඳා ගේ

අතින් ගන්නට උත්සාහ කළ විට බිළිඳා එය ප්‍රතික්ෂේප කරයි, එය ආ පස්සට කර අඬයි. බිළිඳා ආත්මාර්ථකාමී නොවේද?බිළිඳාට මෙම පුරුද්ද ඉගැන්වූයේ කවුද? කිසිවකු නොවේ.එසේ නම් බිළිඳා මෙම පුරුද්ද ඉගෙන ගත්තේ කොහෙන්ද? අපගේ උත්පත්තියට පෙර පවා අපගේ ජීවිත වලට පාපය කාවැදී ඇත්තේ කෙසේදැයි යන්නට මෙය හොඳ උදාහරණයකි.

බොහෝ අයට පාපය යන සංකල්පය සමඟ ගැටළු පවතී.සමහරවිට අප යහපත් වීමට උත්සාහ දරණ අවස්ථාවන්හිදී පවා බොරු කීම ,තෘෂ්ණාව,ඊර්ෂ්‍යාව, කේන්තිය, නරක සිතුවිලි වලින් කෙලවර වන අවස්ථා සහ අන් අය රිදවන විවේචන සිදුකිරීම පිළිගැනීමට පවා අපහසුය.

මෙම සියළු පාපයන්ගෙ න් සදාකාලයටම නිදහස්වීමේ අවශ්‍යතාව එවිට ඔබ තේරුම් ගනීවී.එසේම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ කොටගෙන දෙවියන්වහන්සේගෙන් ලැබෙන සමාවදීම තුළින් පමණක් මෙය කළ හැකිය.

**අප පාපයෙන් ඈත්ව සිටින්නේ කෙසේද?**

දෙවියන්වහන්සේ සමඟ වඩ වඩා සමීපව ගමන් කරන මොහොතේ, වැරදි මොනවාද, නිවැරදි මොනවාද යන්න පිළිබඳව වඩ වඩා දැනුවත් වේ.එසේම දෙවියන්වහන්සේගේ ශුද්ධකම, පාපයෙන් ඈත් වී සිටීමට අපට උපකාර කරයි.

දෙවියන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයක් වර්ධනය කිරීම අපට වැදගත් වේ.

**අපගේ පාප උදෙසා අප සමාව ලබනුයේ කෙසේද?**

යේසුස් වහන්සේ මිය ගියේ අපේ පාප වෙනුවෙනි.අපි එතුමා කෙරේ අදහා ගන්නා විට, එනම් එතුමා දෙවියන්වහන්සේගේ පුත්‍රයා සහ අපගේ ගැළවුම්කරු ලෙස

එතුමා පිළිගන්නා විට , අපට අපගේ පාප එතුමාට කියා දී, පසුතැවිලි වී එතුමාගේ සමාව බලාපොරොත්තු විය හැකිය.එවිට එතුමා අපට අපගේ පාප සෝදා හැර සමාව දෙන සේක. අපි එතුමා සමඟ නව මැවිල්ලක් බවට පත්වන්නෙමු. අපගේ සියළුම අතීත පාප වලට සමාව දෙනුයේ සහ අමතක කරනු ලබනුයේ දෙවියන්වහන්සේ විසිනි.

**මම නිතරම අන් අයට උපකාර කොට ඔවුන් සළකන්නෙමි. මා තුල කිසි පාපයක් නැත.පාපය ගැන කතා කරන්නේ ඇයි?**

යහපත් දේ කිරීම සහ අන් අයට උපකාර කරනවා ය යනුවෙන් කී පමණින් යමෙක් පාපයෙන් තොර යයි කිව නොහැක.පාපය යනු, සොරකම් කිරීම, මිනී මැරීම, කොල්ලකෑම හෝ වෙනත් එවැනි අපරාධම පමණක් නොවේ. අපි කෝප වන විට, ආඩම්බර වන විට, නොහික්මුණු විට, බොරු කියන විට, තෘෂ්ණා සහිත වනවිට යනා දී දේ වලදී ද අපි පව් කරන්නෙමු.

සමහර විට අපට අපගේ අඩුලුහුඩුකම් සහ අසමර්ථකම් පිළිගැ නීමට අමාරු වේ.ඒවා පිළිබඳව පසුතැවිලිවීම සහ කථා කිරීම ඊටත් වඩා අපහසුය. දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් අප අපගේ පාප වලින් නිදහස් වීමය. එතුමාගේ කැමැත්ත නම් අපි අපගේ වැරදීම් සහ පාප එතුමාට කියා දී පසුතැවිලි වීමය. එවිට ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් අපව සෝදා හැර පවිත්‍ර කිරීමට එතුමාට පුළුවන.

**පාප පාපොච්චාරණය යනු කුමක්ද? මා පාපොච්චාරණය කළ යුත්තේ ඇයි?**

පාප පාපොච්චාරණය යනු අප අපගේ ජීවිතයේ කර තිබෙන පාප පිළිබඳව දැණුවත් වීමේ ක්‍රියා මාර්ගය සහ එම අඩුලුහුඩුකම් අප අපගේ ජීවිතයේ සිදු කළේ යැයි දෙවියන්වහන්සේට දන්වාලීමේ ක්‍රියාවය. අප අපගේ පාප කියා දෙන විට පසුතැවිලිවීම සහ එතුමාගෙන් සමාව ඇයද සිටීමද අවශ්‍යය.

“ අප අපේ පාප කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්නටත්, සියලු අධර්මිෂ්ඨකම් වලින් අපව පවිත්‍ර කරන්නටත් උන්වහන්සේ විශ්වාසව, ධර්මිෂ්ඨව සිටින සේක” යනුවෙන් දේව වචනය අපට පොරොන්දු වේ.

**පසුතැවිලිවීම යනු කුමක්ද?යමෙක් පසුතැවිය යුත්තේ කෙසේද?**

පාප පාපොච්චාරණයට අමතරව එම පාප සහ අපගේ අතීත වැරදි ක්‍රියාවන් පිළිබඳව අප පසුතැවීම දෙවියන්වහන්සේගේ කැමැත්තය.අපගේ පරණ පව්කාර ක්‍රියා වලින් හැරී, ඒ වෙනුවට අප එතුමා අනුගමනය කිරීම එතුමාගේ කැමැත්තය.

පසුතැවිලිවීම යනු වැරදි සහ පාප සිදුකිරීම පිළිබඳව දැඩි ලෙස ශෝක වීම සහ කණගාටුවීමය. සැබෑ පසුතැවිලිවීම එම වැරදි නැවත නැවතත් සිදු නොකිරීමේ ආශාව අප තුළ ඇති කරයි.

දෙවියන්වහන්සේගේ සමාව ඉල්ලමින් අප එතුමන් වෙතට ළං වන විට යහපත්වීමට අවශ්‍ය ශක්තිය අපට දෙන ලෙසද අපි එතුමන්ගෙන් ඉල්ලා සිටින්නෙමු.

පසුතැවිලිවීම යනු අප සර්ව සම්පූර්ණ බවට පත්වීම නොවේ. සමහර කාල වලදී අපි පසුබට වන බව අපගේ ප්‍රේමණීය ස්වර්ගික පියාණන් වන දෙවියන්වහන්සේ තේරුම් ගන්නා සේක. කෙසේ වෙතත්, එතුමාගේ සමාව ඉල්ලමින්, ශෝකී හදවතකින් එතුමාට ළං වන සෑම මොහොතකම එය අපට ලැබෙනු ඇත. මෙම ක්‍රියාවලියේදී දෙවියන්වහන්සේ අපව යහපතින් යහපතට හැඩගස්වන සේක. එසේම, එතුමා සමඟ අපේ සම්බන්ධතාව ගැඹුරු බවට පත්වන්නේය.

අප පසුතැවිලි වී දෙවියන්වහන්සේ සොයන විට යේසුස් වහන්සේම අපට උපකාර කරන බව බයිබලය පවසයි.

“මගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා නුඹලාට ලියා එවන්නේ නුඹලා පව් නොකරන පිණිසය. යමෙක් පව් කළොත් ධර්මිෂ්ඨ වූ යේසුස් වහන්සේ වන

මැදිහත්කාරයෙක් පියාණන්වහන්සේ වෙත අපට සිටින සේක. උන්වහන්සේ අපේ පව් උදෙසා ශාන්තිකර පූජාවය; අපේ පව් උදෙසා පමණක් නොව මුළු ලෝකයාත් උදෙසාය".

අප දෙවියන්වහන්සේගේ ස්වභාවයෙන් ඉගෙනගත යුතු මෙන්ම ඉතා ළඟින් එතුමා අනුගමනය කළ යුතුය. අප පව් කොට දෙවියන්වහන්සේගේ සමාව ඉල්ලා සිටින්නෙමු. සෑම මොහොතකම දෙවියන්වහන්සේ අපට සමාව දෙන සේක. ඒ සමානවම අප ද අන් අයට සමාව දිය යුතුය.

"නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව, අනු කම්පා ඇතුව සිට ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමා වුන ලෙසම නුඹලාත් එකිනෙකාට කමා වෙයල්ලා" යනුවෙන් දේව වචනය අපට උපදෙස් දෙයි.

**දෙවියන්වහන්සේගේ යුධා යුද යනුවෙන් අදහස් කළේ මොනවාද?**

දෙවියන්වහන්සේගේ යුධා  යුද යනුවෙන් අදහස් කරනුයේ අපගේ එදිනෙදා ජීවිත සටනේ ප්‍රතිවිරුද්ධ බලවේග වලට විරුද්ධව අපට රඳා පැවතිය හැකි ආත්මික ආයුධ වලටය. දෙවියන්වහන්සේගේ යුධා යුද වලට ඇතුලත් වනුයේ ගැලවීම නැමැති හිස් වැසුම, සැබෑකම නැමැති බඳ පටිය, ධර්මිෂ්ඨකම නැමැති ලය වැස්ම, සුභාරංචියේ සූදානම නැමැති පාවහන්, ඇදහිල්ල නැමැති පළිහ සහ දෙවියන්වහන්සේගේ වචනය නැමැති කඩුව යනාදියයි.

කරුණාකර මෙම පොතේ iii කොටස ( යාච්ඤා කොටස) පරිශීලනය කොට,අපගේ  ජීවිත වලට දෙවියන් වහන්සේගේ ආරක්ෂාව ලබා ගැනීම සඳහා දෙවියන් වහන්සේගේ යුධා යුද පැළඳ ගන්නේ කෙසේද සහ යාච්ඤා කරන්නේ කෙසේදැයි සොයා බලන්න. මෙම යාච්ඤාව ඔබගේ උදෑසන ජීවන රටාවේ කොටසක් කරගෙන සෑම උදෑසනකම දෙවියන් වහන්සේගේ යුධා යුද පැළඳ ගන්න. මෙම යාච්ඤා දෙවියන්වහන්සේගේ ශක්තිය සහ බලය තුළ සෑම දිනකම ඔබ මුහුණ දෙන්නාවූ ආත්මික අභියෝග වලට මුහුණ දීමට ඔබව සූදානම් කරනු

ඇත.දෙවියන්වහන්සේගේ යුධා යුද පැළඳ ගැනීමෙන් අපගේ හදවත් සහ මනස් අශුභවාදී සිතුවිලි වලින් සහ අශුභාවාදී හැඟීම් වලින් ආරක්ෂා කර ආත්මික ප්‍රහාර වලට විරුද්ධව ශක්තිමත් ලෙස නැගී සිටින්නට අපට හැකියාව ලබාදේ.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ නිදහස ලැබීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ක්‍රිස්තුස්වහන්සේ තුළ නිදහස යනු කුමක්ද?**

යමෙක් ඇසිය හැකි පළමු ප්‍රශ්නය නම් නිදහස් වන්නේ කුමකින්ද ? යන්නයි. ඔබගේ ජීවිතය පිළිබඳව සිතා බැලීමට ටික මොහොතක් ලබාගන්න. භය, ඊර්ෂ්‍යාව, තිත්තකම, කෝපය, සමාව නොදීම, අතීත වේදනාවන්, ඇබ්බැහිකම්,තෘෂ්ණාව, තමා පිළිබඳ අවතක්සේරුව හෝ ඊට සමාන හැඟීම් හා ක්‍රියාවන් ඔබගේ ජීවිතයේ තිබෙන බව ඔබ දැණුවත්ද?එවැනි දේ ඔබගේ ජීවිතයේ ඇති බව මුලින්ම ප්‍රතික්ෂේප කිරීම සාමාන්‍ය ස්වභාවයයි.

කෙසේ වෙතත්, අපි අවංකව අපගේ හදවත් පරික්ෂා කර බලුවහොත් අප විසින් වැඩිදියුණු කරගත යුතු සහ වඩා යහපත් කරගත යුතු පැති අපට හමුවනු ඇත. නමුත් අප අපේම ශක්තියෙන් වෙනස් වීමට උත්සාහ දරණ විට අපි නැවත නැවතත් පරාජයට පත් වන්නෙමු.එසේම මෙම අශුභවාදී සිතුවිලි වලින්, ක්‍රියා වලින් සහ ආකල්ප වලින් කවදා හෝ නිදහස් විය හැකිද? යි අප විමසන්නෙමු.

අපව නිදහස් කළ හැක්කේ යේසුස් වහන්සේට පමණි.

"නුඹලා සැබෑව දැනගන්නවා ඇත, සබෑ වද නුඹලා නිදහස් කරන්නේ ය"යි.යේසුස් වහන්සේ කී සේක.

අපගේ පුද්ගලික ගැලවුම්කරු ලෙස යේසුස් වහන්සේ පිළිගැනීමෙන්, අප කර තිබෙන පව් පාපොච්චාරණය කිරීමෙන් සහ පසුතැවිලි වීමෙන්, වඩා යහපත් වීමට එතුමාගේ ශක්තිය සහ සමාව ඉල්ලා සිටීමෙන් අපට පාපයෙන් මිදුනාවූ ජීවිතයක් ගත කිරීමේ හැකියාව යේසුස්වහන්සේගේ කුරුසිය මත මරණයෙන් සහ එතුමාගේ

නැවත නැගිටීමෙන් ලැබෙන බව අපගේ හදවත් තුළ විශ්වාස කිරීමෙන්, දෙවියන් වහන්සේගේ අභිමුඛයෙහි කාලය ගත කිරීමෙන්, බයිබලය කියවීමෙන් සහ යාච්ඤාවෙන් කාලය ගත කිරීමෙන් අප පාපයෙන් ඈත් කරවන අතර දෙවියන්වහන්සේ වෙතට ළං කරවනු ඇත.